# ඌව පළාත් සභා

# රාජ්‍ය සේවා කොමිෂන් සභාව

# බලතල පැවරීම

ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ

★ පත් කිරීම්

★ සේවයේ ස්ථිර කිරීම්

★ උසස් කිරීම්

★ විශ්‍රාම ගැන්වීම්

★ විනය පාලනය

★ ස්ථාන මාරු කිරීම්

(ක්‍රියාත්මක දිනය 2013/01/01)

# ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ බලතල පැවරීම

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32(2) වගන්තිය අනුව ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් පවරන ලද බලතල අතුරින් මෙහි මතු සඳහන් කරන I වන උපලේඛනයේ හා II වන උපලේඛනයේ දැක්වෙන බලතල 1990 අංක 28 දරණ පළාත් සභා (සංශෝධන) පනතේ 32(2 අ) වගන්තියට අදාළව පහත දැක්වෙන අංක 1 හි සඳහන් බලතල පැවරීමේ කොන්දේසි යටතේ සඳහන් කර ඇති කොන්දේසි වලට ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් කරනු ලැබූ සංශෝධන සියල්ල ඇතුළත්ව 2013.01.01 දින සිට බලාත්මක වන පරිදි පැවරීමට ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

(ආ) බලතල පැවරීම සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව විසින් මීට පෙර නිකුත් කරන ලද සියලුම නියෝග මෙම නියෝගය ක්‍රියාත්මක වීමත් සමඟම අහෝසි වන්නේ ය. මෙම බලතල පැවරීමේදී යම් විනය පරීක්ෂණයක් පැවැත්වෙන අතරතුරදී යම් නිලධරයකු/සේවකයෙකු සම්බන්ධයෙන් වන විනය බලධරයා වෙනත් විනය බලධරයකු බවට පත්වී ඇති කල්හි එවැනි නිලධරයකුට/සේවකයකුට එරෙහිව වූ විනයානුකූල කටයුතු කිරීම ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 10 වැනි වගන්තියේ /ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්ය සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 10 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සිදුකල යුතු යයිද ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

## 1. බලතල පැවරීමේ කොන්දේසි.

1.1 මෙයට අමුණා ඇති I වැනි උපලේඛන හා II වැනි උපලේඛන යන උපලේඛන වල සඳහන් වන බලතල එම උපලේඛන වල සඳහන් කර ඇති පරිදි නිලධරයන් වෙත මෙයින් පවරනු ලැබේ.

1.2 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ IV වන කොටසේ විධිවිධාන යටතේ ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් කලින් කල පවරනු ලබන බලතල ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එපරිදි පවරනු ලැබිය හැකිය.

**1.3** එසේ පවරනු ලැබූ යම් බලතල යටතේ විනය බලධරයකු විසින් කරන ලද යම් විනයානුකූල නියෝගයක් හෝ පරිපාලන නියෝගයක් මඟින් අතෘප්තියට පත් ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ යම් තැනැත්තකුට එම විනය නියෝගයට එරෙහිව ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනයක්, විනය නියෝගය ලැබී මාස 03 ක් ඇතුලත ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්ය සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 26 වැනි වගන්තියේ සඳහන් ආකාරයට ඉදිරිපත් කළ හැකිය. එවැනි අවස්ථාවක එම අභියාචනය පිළිබඳ සලකා බලා තීරණයක් ගැනීමේ බලය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේ ය. ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි වූ අභියාචනා තීරණයක් පිළිබඳ අතෘප්තියට පත් ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ යම් නිලධරයකුට/සේවකයෙකුට එම නියෝගයට එරෙහිව ඉහත වගන්තිය අනුව ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත අභියාචනයක් කළ හැකි වන්නේ ය.

## 2. බලතල සංශෝධනය.

2.1 යම් නිලධරයකු වෙත පවරනු ලබන බලතල සංශෝධනය කිරීමේ හෝ වෙනස් කිරීමේ බලතල ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා සතු වන්නේ ය.

2.2 එවැනි බලතල සංශෝධන කලින් කලට ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කළ හැකි වන්නේ ය.

## 3. අභියාචනා බලධරයා.

3.1 විනය නියෝගය සම්බන්ධ පළමුවන අභියාචනා බලධරයා වන්නේ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවයි. මාණ්ඩලික නිළධාරීන් (එහෙත් I වැනි උප ලේඛනයේ සහ 2 වැනි උපලේඛනයේ III හා IV හි සඳහන් නිලධරයන් හැර) සම්බන්ධයෙන් විනය කටයුතු කිරීමේදී ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡදයේ 4 වන වගන්තියේ / ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්ය සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 04 වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කිරීම ඌව පළාත් අමාත්‍යාංශ ලේකම් / ඌව පළාත් සභා දෙපාර්තමේන්තු ප්‍රධානීන් යන අයගේ වගකීම වන්නේ ය.

3.2 වෙනත් පළාත් සභා රාජ්‍ය සේවයකින් හෝ රාජ්‍ය සේවයෙන් ස්ථාන මාරුවීම් ලැබ ඌව පළාත් සභා රාජ්‍ය සේවයට වාර්තා කිරීමෙන් පසු එකී නිලධරයන් හා සේවකයින් ඌව පළාත් සභා රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉටු කරනු ලැබේ.

## 4. විශ්‍රාම ගැන්වීම්.

4.1 මෙම බලතල පැවරීම මගින් බලය පවරා ඇත්තේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 - 17 වගන්ති යටතේ විශ්‍රාම යන නිලධරයන් / සේවකයින් විශ්‍රාම ගැන්වීම් සඳහා පමණි. ඊට අමතරව පහත දැක්වෙන සියළුම විශ්‍රාම ගැන්වීම් සඳහා වන බලය මෙම කොමිෂන් සභාව සතු වන්නේය.

(අ) සේවයෙන් පහ කිරීම වෙනුවට සානුකම්පිත විකල්පයක් වශයෙන් අනිවාර්ය විශ්‍රාම ගැන්වීම්

(ආ) වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වීම්

(ඇ) විනය නියෝග මත විශ්‍රාම ගැන්වීම්

(ඈ) අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගැන්වීම්

(ඉ) වෙනත් හේතූන් මත විශ්‍රාම ගැන්වීම්

4.2 දීපව්‍යාප්ත සේවාවල නිලධරයන්ගේ සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම අනුමත කිරීම අදාළ පත්වීම් බලධාරීන් මඟින් සිදු කෙරේ.

## 5. නැවත සේවයේ යෙදවීම හා කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම.

5.1 දීපව්‍යාප්ත සේවයේ විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයේ යෙදවීම ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ මත ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් තීරණය කරනු ලැබේ.

5.2 ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ අවශ්‍යතාවය මත විශ්‍රාමික රාජ්‍ය සේවයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ යම් තැනැත්තෙකු/වෙනත් යම් තැනැත්තෙකු නැවත සේවයේ යෙදවීම/කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ සහ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශ මත ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අනුව ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලැබේ.

5.3 අමාත්‍යාංශ හා ඊට අදාළ දෙපාර්තමේන්තු වල විශේෂ ව්‍යාපෘති සඳහා නිලධාරීන්/සේවකයින් කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම ඌව පළාතේ ප්‍රධාන ලේකම්තුමාගේ නිර්දේශය මත ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය යටතේ අදාල විෂයභාර ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම් විසින් කරනු ලැබේ.

5.4 ඉහත නිලධරයකුගේ විනය පාලනය සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්ගේ/ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ මත ගරු ආණ්ඩුකාරතුමා විසින් අවසාන තීරණය ලබාදෙනු ඇත.

## 6. දීප ව්‍යාප්ත සේවයේ අනුයුක්ත කිරීම්.

i. ශ්‍රී ලංකා පරිපාලන සේවය
ii. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය
iii. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය
iv. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය
v. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය
vi. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය
vii. ශ්‍රී ලංකා සැලසුම් සේවය
viii. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය
ix. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය
x. ශ්‍රී ලංකා වෛද්‍ය සේවය
xi. ශ්‍රී ලංකා දේශීය වෛද්‍ය සේවය
xii. ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය

ඉහත දීපව්‍යාප්ත සේවාවල අනුයුක්ත කිරීම් ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ඌව පළාතේ ප්‍රධාන ලේකම් විසින් සිදුකරනු ලැබේ.

7. **විදුහල්පති තනතුරට පත් කිරීම්.**

7.1 ඌව පළාත් සභා රාජ්‍ය සේවයට ද්විතියික පදනම මත මුදාහැර ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධරයන් හා විදුහල්පති සේවයේ නිලධරයන් ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ පාසල් සඳහා විදුහල්පති/ නියෝජ්‍ය විදුහල්පති තනතුරු සඳහා පත් කිරීම ඌව පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ සහ ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ හා ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශ පරිදි ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අනුව ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

8. **බඳවා ගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථා.**

8.1 ඌව පළාත් සභා අමාත්‍යාංශ හා ඌව පළාත් සභා දෙපාර්තුමේන්තු වලට අවශ්‍ය කාර්ය මණ්ඩල පත් කිරීම සඳහා වන බඳවා ගැනීමේ පටිපාටි / සේවා ව්‍යවස්ථා සංග්‍රහයන් එකී තනතුරු වලට ගැලපෙන අයුරින් හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වලටද අනුකූල වන පරිදි සකස් කර අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව ඌව පළාතේ ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීම ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ හා අමාත්‍යාංශ ලේකම් වරුන්ගේ වගකීම වන්නේය.

8.2 මෙම බලතල පැවරීම යටතේ වන ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සියළු බඳවා ගැනිම් ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බඳවා ගැනිම් පටිපාටි/ සේවා ව්‍යවස්ථා සහ ඊට අදාළ සංශෝධන වලට අනුකූලව ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද ගැසට් පත්‍රයේ සඳහන් ඌව පළාත් සභා **රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති** සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව සිදුකළ යුතු වේ.

8.3 ඉහත කරුණු අනුව ඉදිරිපත් කරන ලද බඳවා ගැනීමේ පටිපාටි/ සේවා ව්‍යවස්ථා සංග්‍රහයන් පරික්ෂාකර බලා අනුමැතිය සඳහා ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමන් වෙත ඉදිරිපත් කිරිමට මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ අධික්ෂණය යටතේ සිදුකළ යුතු වන්නේ ය.

9. **පොදු කොන්දේසි**

9.1 ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්, ඌව පළාත් සභාවේ සභා ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම් වරුන්, ඌව පළාත් සභා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, ඌව පළාත් සභා සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්, ඌව පළාත් පාලන කොමසාරිස් හා ඌව පළාත් පාලන ආයතනවල පරිපාලන නිලධරයන් වෙත පවරා ඇති බලතල වලට අනුව එකී තනතුරු වලට බඳවා ගැනීමට පෙර අනුමත කාර්ය මණ්ඩල සම්බන්ධයෙන් ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය.

9.2 ජ්‍යෙෂ්ඨත්වය පදනම් කරගෙන කරනු ලබන උසස්වීම් සම්බන්ධයෙන් ඒ ඒ සේවාවන්වලට අදාළ වන පරිදි ජ්‍යෙෂ්ඨතා ලේඛන ඊට සම්බන්ධ දෙපාර්තමේන්තු ප්‍රධානින් විසින් සකස් කොට යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. උසස්වීම් සිදුකරන අවස්ථාවල එකී ජ්‍යෙෂ්ඨතා ලේඛන අදාළ අමාත්‍යාංශ ලේකම් මඟින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

9.3 ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ V වැනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය යටතේ / ඌව පළාත් සභා විනය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 37 වැනි වගන්තිය යටතේ තනතුර අතහැර යාමේ නියෝග නිකුත් කිරීම මෙහි බලතල පැවරීමේ සඳහන් වන පරිදි වූ විනය බලධාරියා හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ප්‍රාදේශීය දෙපාර්තමේන්තු ප්‍රධානියකු වන මාණ්ඩලික නිලධරයකු විසින් කළ යුතුය. ගුරු සේවයේ නිලධරයන් සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් හෝ ඔහුගේ ආවරණ අනුමැතියට යටත්ව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා/අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට මෙම බලතල ක්‍රියාත්මක කළ හැකි වන්නේය.

9.4 මීට ප්‍රථම පවරන ලද බලතල අනුව මේ වන විට නිම නොවී ඇති කාර්යන් සම්බන්ධයෙන් මෙම බලතල පැවරීම අදාළ නොවේ.

9.5 මෙම බලතල පැවරීම යටතේ කිසියම් නිලධරයකුට පවරා ඇති බලතල ඔහු විසින් ක්‍රියාත්මක කළ යුතුය. එකී බලතල වෙනත් නිලධරයකුට පැවරිය නොහැක. ඉහත සඳහන් කරුණු පිළිබඳව තීරණයක් ගැනීමට යම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසා කොමිෂන් සභාවේ තීරණය පරිදි කටයුතු කළ යුතුය.

ඩී.කේ.එම්.කේ. දසනායක
සභාපති
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2013 01 මස 01 වන දින
බදුල්ලේ පිහිටි
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී

# අර්ථ නිරූපන

1. පළාත් සභාව යන පදයෙන් අදහස් වන්නේ ඌව පළාත් සභාව වේ.
2. ප්‍රධාන ලේකම් යන පදයෙන් අදහස් වන්නේ ඌව පළාතේ ප්‍රධාන ලේකම් වේ.
3. ආණ්ඩුකාරවර ලේකම් යන පදයෙන් අදහස් වන්නේ ඌව පළාතේ ආණ්ඩුකාරවර ලේකම් වේ.
4. සභා ලේකම් යන පදයෙන් අදහස් වන්නේ ඌව පළාත් සභාවේ සභා ලේකම් වේ.
5. පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් යන පදයෙන් අදහස් වන්නේ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වේ.
6. අදාළ අමාත්‍යාංශ ලේකම් යන පදයෙන් අදහස් වන්නේ ඌව පළාත් සභාවේ විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරුන් වේ.
7. **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් වරුන් යන පදයෙන් අදහස් වන්නේ පහත සඳහන් නිලධරයන් ය.**
    - I. ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
    - II. ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)
    - III. ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)
    - IV. ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)
8. සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම් යන පදයෙන් අදහස් වන්නේ ඌව පළාත් සභා සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් වේ.
9. **දෙපාර්තමේන්තු ප්‍රධාන යන පදයෙන් අදහස් වන්නේ ඌව පළාත් සභාවේ පහත සඳහන් නිලධරයන් ය.**
    - I. ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
    - II. ඌව පළාත්, පළාත් පාලන කොමසාරිස්
    - III. ඌව පළාත් ආදායම් කොමසාරිස්
    - IV. ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
    - V. ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්
    - VI. ඌව පළාත් ආයුර්වේද කොමසාරිස්
    - VII. ඌව පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ
    - VIII. ඌව පළාත් ඉඩම් කොමසාරිස්
    - IX. ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ
    - X. ඌව පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස්
    - XI. ඌව පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ
    - XII. ඌව පළාත් මාර්ග සංවර්ධන අධ්‍යක්ෂ

XIII. ඌව පළාත් කර්මාන්ත සංවර්ධන අධ්‍යක්ෂ
XIV. ඌව පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ
XV. ඌව පළාත් ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ
XVI. ඌව පළාත් අධ්‍යක්ෂ (මූල්‍ය)
XVII. ඌව පළාත් අධ්‍යක්ෂ (අයවැය)
XVIII. ඌව පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ
XIX. ඌව පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ
XX. ඌව පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ
XXI. ඌව පළාත් ග්‍රාමසංවර්ධන අධ්‍යක්ෂ
XXII. ඌව පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ

***මෙම තනතුරු වල වැඩ බැලීම/රාජකාරී ඉටු කිරීම/රාජකාරී ආවරණය කිරීම සඳහා විධිමත්ව පත්කළ නිලධරයන් මෙම ගණයට අයත් වේ***

10. **ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනයන්හි පරිපාලන බලධරයා යන පදයෙන් අදහස් වන්නේ පහත සඳහන් නිලධරයන් ය.**

I. මහා නගර සභා - නාගරික කොමසාරිස්
II. නගර සභා - නාගරික ලේකම්
III. ප්‍රාදේශීය සභා - ප්‍රාදේශීය සභා ලේකම්

11.**ප්‍රාදේශීය දෙපාර්තමේන්තු ප්‍රධාන යනුවෙන් අදහස් වන්නේ පහත සඳහන් නිලධරයන් ය.**

I. අධ්‍යක්ෂ, ඌව කළමනාකරණ සංවර්ධන ආයතනය
II. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,බදුල්ල
III. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,මොණරාගල
IV. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ,බදුල්ල
V. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ, මොණරාගල
VI. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ, සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය, බිඳුණුවැව
VII. සහකාර පළාත් පාලන කොමසාරිස්, බදුල්ල
VIII. සහකාර පළාත් පාලන කොමසාරිස්, මොණරාගල
IX. සමූපකාර සංවර්ධන උපකොමසාරිස්, බදුල්ල
X. සමූපකාර සංවර්ධන උපකොමසාරිස්, මොණරාගල

**1990 අංක 28 දරණ පනතින් සංශෝධිත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ**

**32 වන වගන්තිය ප්‍රකාරව ඌව පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් / සේවකයන්, පත්කිරීම්/සේවයේ ස්ථිර කිරීම්/උසස් කිරීම්/සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම්/ විනය පිළිබඳ බලතල පැවරීම**

**ක්‍රියාත්මක වන දිනය 2013/01/01**

| | සේවාව | පත් කිරීම | සේවයේ ස්ථිර කිරීම | උසස් කිරීම් | සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම | විනය පාලනය |
|---|---|---|---|---|---|---|
| 1 | ඌව පළාතේ ආණ්ඩුකාරවර ලේකම්/ ඌව පළාත් සභාවේ සභා ලේකම්/ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්/ ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්/ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්/ ඌව පළාත් සභා සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්, ඌව පළාත් සභාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ඌව පළාත් සභාවේ පළාත් අධ්‍යක්ෂවරුන්/ ඌව පළාත් සභාවේ අධ්‍යක්ෂවරුන්/ ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රාදේශීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් | ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා | අදාළ පත්වීම් බලධරයන් | අදාළ පත්වීම් බලධරයන් | ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය මත ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟතාවය මත අදාළ පත්වීම් බලධරයන් | ගරු ආණ්ඩුකාරතුමන්ගේ උපදෙස් / නිර්දේශ පරිදි අදාළ පත්වීම් බලධරයන් |
| 2 | (අ.) ඌව පළාත් සභා රාජ්‍ය සේවය සඳහා මුදා හැර ඇති දීප ව්‍යාප්ත සේවාවලට අයත් නිලධරයන් (ඉහත අංක 1 හි නිලධාරීන් හා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධරයන් හැර) | ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ඌව පළාතේ ප්‍රධාන ලේකම් | අදාළ පත්වීම් බලධරයන් | ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය මත ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අනුව අදාළ පත්වීම් බලධරයන් | ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟතාවය මත අදාළ පත්වීම් බලධරයන් | ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමන්ගේ උපදෙස් / නිර්දේශ පරිදි අදාළ පත්වීම් බලධරයන් |
| | (ආ.) ඌව පළාත් සභා රාජ්‍ය සේවයට මුදාහැර ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධරයන් | ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අනුව ඌව පළාතේ ප්‍රධාන ලේකම් | අදාළ පත්වීම් බලධරයන් | ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය මත ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අනුව අදාළ පත්වීම් බලධරයන් | ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟතාවය මත අදාළ පත්වීම්බලධරයන් | රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක 04/03 හා 2003/12/02 දිනැති චක්‍රලේඛය හා ඊට අදාළ සංශෝධනද ඇතුලත් පරිදි අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් |

**1990 අංක 28 දරණ පනතින් සංශෝධිත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ**

**32 වන වගන්තිය ප්‍රකාරව ඌව පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් / සේවකයන්, පත්කිරීම්/සේවයේ ස්ථිර කිරීම්/උසස් කිරීම්/සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම්/ විනය පිළිබඳ බලතල පැවරීම**

**ක්‍රියාත්මක වන දිනය 2013/01/01**

| | සේවාව | පත් කිරීම | සේවයේ ස්ථිර කිරීම | උසස් කිරීම් | සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම | විනය පාලනය |
|---|---|---|---|---|---|---|
| 2 | (ඇ.) දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නොවන සහකාර අධ්‍යක්ෂ, ඉංජිනේරු තක්සේරුකරු යනාදී හෝ ඒ හා සමාන තනතුරු (ඉහත අංක 01, 02 (අ) හා 02 (ආ) හි සඳහන් නොවන අනෙකුත් නිලධරයන්) | ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය මත හා ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශ පරිදි ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අනුව ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය මත හා ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය පරිදි ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අනුව ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | අදාළ විෂයභාර ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන් |
| | (ඈ.) ඌව පළාත් සභා රාජ්‍ය සේවයට අයත් මාණ්ඩලික මට්ටමේ නිලධරයන් (ඌව පළාත් සභා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියේ, ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අධි ශ්‍රේණියේ, ඌව පළාත් සභා හෙද සේවයේ අධි ශ්‍රේණියේ) | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | -------- | -------- | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාතේ ආණ්ඩුකාර ලේකම්, ඌව පළාත් සභාවේ සභා ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්, ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, ඌව පළාත් සභා සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් |

**1990 අංක 28 දරණ පනතින් සංශෝධිත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ**

**32 වන වගන්තිය ප්‍රකාරව ඌව පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් / සේවකයන්, පත්කිරීම්/සේවයේ ස්ථිර කිරීම්/උසස් කිරීම්/සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම්/ විනය පිළිබඳ බලතල පැවරීම**

**ක්‍රියාත්මක වන දිනය 2013/01/01**

| | සේවාව | පත් කිරීම | සේවයේ ස්ථිර කිරීම | උසස් කිරීම් | සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම | විනය පාලනය |
|---|---|---|---|---|---|---|
| 3 | ශ්‍රී ලංකා විදුහල්පති සේවය | රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක 04/03 හා 2003/12/02 දිනැති චක්‍රලේඛය අනුව අදාළ බලධරයන් | රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක 04/03 හා 2003/12/02 දිනැති චක්‍රලේඛය අනුව අදාළ බලධරයන් | රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක 04/03 හා 2003/12/02 දිනැති චක්‍රලේඛය අනුව අදාළ බලධරයන් | ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අනුව අදාළ පත්වීම් බලධරයන් | රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක 04/03 හා 2003/12/02 දිනැති චක්‍රලේඛය හා ඊට අදාළ සංශෝධනද ඇතුලත් පරිදි අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් |
| 4 | ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ගුරු සේවය සහ ගුරු සහායක | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශය මත ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක | ඌව පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් | ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | ඌව පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් |
| 5 | ඌව පළාත් සභා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය (ඌව පළාත් සභා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණිය හැර) | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාතේ ආණ්ඩුකාර ලේකම්, ඌව පළාත් සභාවේ සභා ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්, ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, ඌව පළාත් සභා සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් |

**1990 අංක 28 දරණ පනතින් සංශෝධිත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ**

**32 වන වගන්තිය ප්‍රකාරව ඌව පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් / සේවකයන්, පත්කිරීම්/සේවයේ ස්ථිර කිරීම්/උසස් කිරීම්/සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම්/ විනය පිළිබඳ බලතල පැවරීම**

**ක්‍රියාත්මක වන දිනය 2013/01/01**

| | සේවාව | පත් කිරීම | සේවයේ ස්ථිර කිරීම | උසස් කිරීම් | සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම | විනය පාලනය |
|---|---|---|---|---|---|---|
| 6 | ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවය (ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අධි ශ්‍රේණිය හැර) | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | අදාළ විෂයභාර ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම්/ ඌව පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) |
| 7 | සංවර්ධන සහකාර/ වැඩසටහන් සහකාර/ මූල්‍ය සහකාර/ කළමනාකරණ සහකාර/ නීති සහකාර/ සැපයුම් සහකාර/ වැඩසටහන් නිලධාරී ආදී රජයේ ප්‍රමුඛතා කාර්යයන් සඳහා බඳවාගත් සියළුම උපාධිධාරීන්/ ග්‍රාම සංවර්ධන නිලධාරී/ ප්‍රජා සංවර්ධන නිලධාරි/ විමර්ශන නිලධාරි/ බඳු නිලධාරි/ සමාජ සේවා නිලධාරි/ සමූපකාර සංවර්ධන නිලධාරී / පුස්තකාලයාධිපති/ භාෂා පරිවර්තක/ හැන්සාඩ් සංස්කාරක / ආදායම් පරීක්ෂක | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාතේ ආණ්ඩුකාර ලේකම්, ඌව පළාත් සභාවේ සභා ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්, ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, ඌව පළාත් සභා සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් |

**1990 අංක 28 දරණ පනතින් සංශෝධිත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ**

**32 වන වගන්තිය ප්‍රකාරව ඌව පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් / සේවකයන්, පත්කිරීම්/සේවයේ ස්ථිර කිරීම්/උසස් කිරීම්/සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම්/ විනය පිළිබඳ බලතල පැවරීම**

**ක්‍රියාත්මක වන දිනය 2013/01/01**

| | සේවාව | පත් කිරීම | සේවයේ ස්ථිර කිරීම | උසස් කිරීම් | සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම | විනය පාලනය |
|---|---|---|---|---|---|---|
| 8 | ආයුර්වේද ඖෂධ සංයෝජක/ පරිගණක දත්ත ක්‍රියාකරු/ ගිනිහට/ මහජන සෞඛ්‍ය පරීක්ෂක (පළාත් පාලන)/ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී (පළාත් පාලන)/ ආදායම් පරිපාලක / පෙර පාසල් පාලිකා /ක්‍රීඩා නිලධාරී/ භාෂණ පරිවර්තක/ කාර්මික ගුරු/ වැඩසටහන් නිෂ්පාදක/ ප්‍රමාණ සමීක්ෂක/ ජ්‍යෙෂ්ඨ ජේෂකර්ම පරිපාලිකා/ ජේෂකර්ම උපදේශක/ මැහුම් උපදේශිකා/ වේවැල් උපදේශක/ වඩු ප්‍රදර්ශක/ මැටි ප්‍රදර්ශක/ කොහු ප්‍රදර්ශක/ නේවාසිකාගාර පාලක/ පටිගත කිරීමේ ශිල්පී/ නිශ්චල ඡායා රූප ශිල්පී/ චිත්‍ර ශිල්පී/ මුද්‍රණ සහායක/ වර්ණ සංයෝජක | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | අදාළ විෂයභාර අමාත්‍යාංශ ලේකම් | අදාළ විෂයභාර ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම් |
| 9 | ශ්‍රී ලංකා වෛද්‍ය සේවයේ නිලධරයන් හා ඌව පළාත් සභා රාජ්‍ය සෞඛ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයන් හැර සෞඛ්‍ය සේවයේ අනිකුත් නිලධරයන් | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | අදාළ විෂයභාර ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම් | අදාළ විෂයභාර ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම් |

**1990 අංක 28 දරණ පනතින් සංශෝධිත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ**

**32 වන වගන්තිය ප්‍රකාරව ඌව පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් / සේවකයන්, පත්කිරීම්/සේවයේ ස්ථිර කිරීම්/උසස් කිරීම්/සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම්/ විනය පිළිබඳ බලතල පැවරීම**

**ක්‍රියාත්මක වන දිනය 2013/01/01**

| | සේවාව | පත් කිරීම | සේවයේ ස්ථිර කිරීම | උසස් කිරීම් | සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම | විනය පාලනය |
|---|---|---|---|---|---|---|
| 10 | ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ රියදුරු සේවය | ඌව පළාතේ ආණ්ඩුකාර ලේකම්, ඌව පළාත් සභාවේ සභා ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්, ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, ඌව පළාත් සභා සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් | ඌව පළාතේ ආණ්ඩුකාර ලේකම්, ඌව පළාත් සභාවේ සභා ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්, ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, ඌව පළාත් සභා සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් | ඌව පළාතේ ආණ්ඩුකාර ලේකම්, ඌව පළාත් සභාවේ සභා ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්, ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, ඌව පළාත් සභා සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් | ඌව පළාතේ ආණ්ඩුකාර ලේකම්, ඌව පළාත් සභාවේ සභා ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්, ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, ඌව පළාත් සභා සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් | ඌව පළාතේ ආණ්ඩුකාර ලේකම්, ඌව පළාත් සභාවේ සභා ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්, ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, ඌව පළාත් සභා සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් |
| 11 | ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය රියදුරු සේවය | ඌව පළාත් සභා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් | ඌව පළාත් සභා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් | ඌව පළාත් සභා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් | ඌව පළාත් සභා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් | ඌව පළාත් සභා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් |

**1990 අංක 28 දරණ පනතින් සංශෝධිත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ**

**32 වන වගන්තිය ප්‍රකාරව ඌව පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් / සේවකයන්, පත්කිරීම්/සේවයේ ස්ථිර කිරීම්/උසස් කිරීම්/සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම්/ විනය පිළිබඳ බලතල පැවරීම**

**ක්‍රියාත්මක වන දිනය 2013/01/01**

| | සේවාව | පත් කිරීම | සේවයේ ස්ථිර කිරීම | උසස් කිරීම් | සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම | විනය පාලනය |
|---|---|---|---|---|---|---|
| 12 | ඌව පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලය/ ඌව පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලය/ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ ඌව පළාත් සභා සමූපකාර සේවක කොමිෂන් සභාව/ ඌව පළාත් සභා අමාත්‍යාංශ කාර්යාල වල/ ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාල වල හා ඊට අදාළ දෙපාර්තමේන්තු වලට අයත් කණිෂ්ඨ කාර්ය මණ්ඩලය (ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතන වල පහත අංක 13, 14 හා 15 තනතුරු හැර) | ඌව පළාතේ ආණ්ඩුකාර ලේකම්, ඌව පළාත් සභාවේ සභා ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්, ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, ඌව පළාත් සභා සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් | ඌව පළාතේ ආණ්ඩුකාර ලේකම්, ඌව පළාත් සභාවේ සභා ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්, ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, ඌව පළාත් සභා සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් | ඌව පළාතේ ආණ්ඩුකාර ලේකම්, ඌව පළාත් සභාවේ සභා ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්, ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, ඌව පළාත් සභා සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් | ඌව පළාතේ ආණ්ඩුකාර ලේකම්, ඌව පළාත් සභාවේ සභා ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්, ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, ඌව පළාත් සභා සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් | ඌව පළාතේ ආණ්ඩුකාර ලේකම්, ඌව පළාත් සභාවේ සභා ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්, ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, ඌව පළාත් සභා සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් |
| 13 | නගර සභා / ප්‍රාදේශීය සභා කාර්යාල වල කණිෂ්ඨ සේවකයින් (කා.කා.ස.සේවය හා අංක 15 සඳහන් තනතුරු හැර) | ඌව පළාත් සභා පළාත් පාලන කොමසාරිස් | ඌව පළාත් සභා පළාත් පාලන කොමසාරිස් | අදාළ විෂයභාර ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම් | ඌව පළාත් සභා පළාත් පාලන කොමසාරිස් | ඌව පළාත් සභා පළාත් පාලන කොමසාරිස් |
| 14 | මහා නගර සභා සඳහා කණිෂ්ඨ සේවකයින් (කා.කා.ස.සේවය හැර) | නාගරික කොමසාරිස් | නාගරික කොමසාරිස් | ඌව පළාත් සභා පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම් | නාගරික කොමසාරිස් | ඌව පළාත් සභා පළාත් පාලන කොමසාරිස් |
| 15 | නගර සභා හා ප්‍රාදේශීය සභා වල මාර්ග/සෞඛ්‍ය/ විදුලි හා ජල කම්කරුවන් | නාගරික ලේකම්/ප්‍රාදේශීය සභා ලේකම් | නාගරික ලේකම්/ප්‍රාදේශීය සභා ලේකම් | ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස් | පළාත් පාලන කොමසාරිස් | පළාත් පාලන කොමසාරිස් |

**1990 අංක 28 දරණ පනතින් සංශෝධිත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ**

**32 වන වගන්තිය ප්‍රකාරව ඌව පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් / සේවකයන්, පත්කිරීම්/සේවයේ ස්ථිර කිරීම්/උසස් කිරීම්/සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම්/ විනය පිළිබඳ බලතල පැවරීම**

**ක්‍රියාත්මක වන දිනය 2013/01/01**

| | සේවාව | පත් කිරීම | සේවයේ ස්ථිර කිරීම | උසස් කිරීම් | සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම | විනය පාලනය |
|---|---|---|---|---|---|---|
| 16 | ඉහත 1 සිට 15 දක්වා සඳහන් කර ඇති තනතුරු වලින් ආවරණය නොවන ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ අනෙකුත් තනතුරු සඳහා | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | අදාළ විෂයභාර ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම් | අදාළ විෂයභාර ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම් |

# 1990 අංක 28 දරණ පනතින් සංශෝධිත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32 වන වගන්තිය ප්‍රකාරව ඌව පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ / සේවකයින්ගේ ස්ථාන මාරුවීම් පිළිබඳ බලතල පැවරීම (ක්‍රියාත්මක දිනය 2013/01/01)

| | සේවාව | ස්ථාන මාරු (පළාත තුළ) | | | පළාතෙන් බැහැර |
|---|---|---|---|---|---|
| | | ආයතනය/ දෙපාර්තමේන්තුව/ කලාප තුළ | අමාත්‍යාංශය යටතේවන දෙපාර්තමේන්තු අතර | අමාත්‍යාංශ අතර | |
| 1 | ඌව පළාතේ ආණ්ඩුකාරවර ලේකම්/ ඌව පළාත් සභාවේ සභා ලේකම්/ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්/ ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්/ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්/ ඌව පළාත් සභා සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්, ඌව පළාත් සභාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ඌව පළාත් සභාවේ පළාත් අධ්‍යක්ෂවරුන්/ ඌව පළාත් සභාවේ අධ්‍යක්ෂවරුන්/ ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රාදේශීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ (ඌව පළාත් සභාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්) | ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා | ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා | ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා | ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා |
| 2 | අ.) ඉහත අංක 1 හි නිලධරයන් හා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධරයන් හා ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් හැර ඌව පළාත් සභා රාජ්‍ය සේවය සඳහා මුදා හැර ඇති දීපව්‍යාප්ත සේවාවලට අයත් නිලධරයන් | ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟතාවය මත ඌව පළාතේ ප්‍රධාන ලේකම් | ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟතාවය මත ඌව පළාතේ ප්‍රධාන ලේකම් | ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟතාවය මත ඌව පළාතේ ප්‍රධාන ලේකම් | ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟතාවය මත ඌව පළාතේ ප්‍රධාන ලේකම් |
| | ආ.) ඌව පළාත් සභා රාජ්‍ය සේවයට මුදාහැර ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධරයන් | ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟතාවය මත ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | -------- | -------- | ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟතාවය මත ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| | ඇ.) දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නොවන සහකාර අධ්‍යක්ෂ, ඉංජිනේරු තක්සේරුකරු යනාදී හෝ ඒ හා සමාන තනතුරු (ඉහත අංක 01, 02 (අ) හා 02 (ආ) හි සඳහන් නොවන අනෙකුත් නිලධරයන්) | ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟතාවය මත ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | -------- | -------- | ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟතාවය මත ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව |

# 1990 අංක 28 දරණ පනතින් සංශෝධිත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32 වන වගන්තිය ප්‍රකාරව ඌව පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ / සේවකයින්ගේ ස්ථාන මාරුවීම් පිළිබඳ බලතල පැවරීම (ක්‍රියාත්මක දිනය 2013/01/01)

| | සේවාව | ස්ථාන මාරු (පළාත තුළ) | | | පළාතෙන් බැහැර |
|---|---|---|---|---|---|
| | | ආයතනය/ දෙපාර්තමේන්තුව/ කලාප තුළ | අමාත්‍යාංශය යටතේවන දෙපාර්තමේන්තු අතර | අමාත්‍යාංශ අතර | |
| | ඈ.) ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් | ඌව පළාත් සභාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් | අදාළ ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම් | ඌව පළාතේ ප්‍රධාන ලේකම් | ඌව පළාතේ ප්‍රධාන ලේකම් |
| | ඉ.) ඌව පළාත් සභා රාජ්‍ය සේවයට අයත් මාණ්ඩලික මට්ටමේ නිලධරයන් (ඌව පළාත් සභා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණිය/ ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අධි ශ්‍රේණිය/ ඌව පළාත් සභා හෙද සේවයේ අධි ශ්‍රේණිය) | අදාළ ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම් | අදාළ ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම් | ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස්/පුහුණු) | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 3 | විධිමත් පරිදි ද්විතියන පදනම මත ඌව පළාත් සභා රාජ්‍ය සේවයට මුදාහැර ඇති ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධරයන් | <u>කලාපය තුළ</u><br><br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ<br><br><u>කලාප අතර</u><br><br>ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | -------- | -------- | රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක 04/03 හා 2003/12/02 දිනැති චක්‍රලේඛය හා ඊට අදාළ සංශෝධනද ඇතුලත් පරිදි අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය පරිදි පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව |

**1990 අංක 28 දරණ පනතින් සංශෝධිත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ**
**32 වන වගන්තිය ප්‍රකාරව ඌව පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ / සේවකයින්ගේ ස්ථාන මාරුවීම් පිළිබඳ බලතල පැවරීම**
**(ක්‍රියාත්මක දිනය 2013/01/01)**

| | සේවාව | ස්ථාන මාරු (පළාත තුළ) | | | පළාතෙන් බැහැර |
|---|---|---|---|---|---|
| | | ආයතනය/ දෙපාර්තමේන්තුව/ කලාප තුළ | අමාත්‍යාංශය යටතේවන දෙපාර්තමේන්තු අතර | අමාත්‍යාංශ අතර | |
| 4 | ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ගුරු සේවය සහ ගුරු සහායක | <u>කළාපය තුළ</u><br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ<br><u>දෙපාර්තමේන්තුව තුළ</u><br>ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | -------- | -------- | ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය පරිදි ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 5 | ඌව පළාත් සභා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය (ඌව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණිය හැර) | අදාළ ඌව පළාත් සභාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් | අදාළ ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම් | ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස්/පුහුණු) | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 6 | ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවය (ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අධි ශ්‍රේණිය හැර) | ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජි.සේවා)/ ඌව පළාත් සභාවේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් | අදාළ ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම්/ ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජි.සේවා) | ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජි.සේවා) | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 7 | සංවර්ධන සහකාර/ වැඩසටහන් සහකාර/ මූල්‍ය සහකාර/ කළමනාකරණ සහකාර/ නීති සහකාර/ සැපයුම් සහකාර/ වැඩසටහන් නිලධාරී ආදී රජයේ ප්‍රමුඛතා කාර්යයන් සඳහා බඳවාගත් සියළුම උපාධිධාරීන්/ ග්‍රාම සංවර්ධන නිලධාරී/ ප්‍රජා සංවර්ධන නිලධාරී/ විමර්ශන නිලධාරී/ බදු නිලධාරී/ සමාජ සේවා නිලධාරී/ සමූපකාර සංවර්ධන නිලධාරී / පුස්තකාලයාධිපති/ භාෂා පරිවර්තක/ හැන්සාඩ් සංස්කාරක / ආදායම් පරීක්ෂක | අදාළ ඌව පළාත් සභාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් | අදාළ ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම් | ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස්/පුහුණු) | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව |

# 1990 අංක 28 දරණ පනතින් සංශෝධිත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32 වන වගන්තිය ප්‍රකාරව ඌව පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ / සේවකයින්ගේ ස්ථාන මාරුවීම් පිළිබඳ බලතල පැවරීම (ක්‍රියාත්මක දිනය 2013/01/01)

| | සේවාව | ස්ථාන මාරු (පළාත තුළ) | | | පළාතෙන් බැහැර |
|---|---|---|---|---|---|
| | | ආයතනය/ දෙපාර්තමේන්තුව/ කලාප තුළ | අමාත්‍යාංශය යටතේවන දෙපාර්තමේන්තු අතර | අමාත්‍යාංශ අතර | |
| 8 | ආයුර්වේද ඖෂධ සංයෝජක/ පරිගණක දත්ත ක්‍රියාකරු/ ගිනිභට/ මහජන සෞඛ්‍ය පරීක්ෂක (පළාත් පාලන)/ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි (පළාත් පාලන)/ ආදායම් පරිපාලක / පෙර පාසල් පාලිකා /ක්‍රීඩා නිලධාරි/ භාෂණ පරිවර්තක/ කාර්මික ගුරු/ වැඩසටහන් නිෂ්පාදක/ ප්‍රමාණ සමීක්ෂක/ ජ්‍යෙෂ්ඨ පේෂකර්ම පරිපාලිකා/ පේෂකර්ම උපදේශක/ මැහුම් උපදේශිකා/ වේවැල් උපදේශක/ වඩු ප්‍රදර්ශක/ මැටි ප්‍රදර්ශක/ කොහු ප්‍රදර්ශක/ නේවාසිකාගාර පාලක/ පටිගත කිරීමේ ශිල්පී/ නිශ්චල ඡායා රූප ශිල්පී/ චිත්‍ර ශිල්පී/ මුද්‍රණ සහායක/ වර්ණ සංයෝජක | අදාළ ඌව පළාත් සභාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් | අදාළ ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම් | ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස්/පුහුණු) | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 9 | ශ්‍රී ලංකා වෛද්‍ය සේවයේ නිලධරයන් හා ඌව පළාත් රාජ්‍ය සෞඛ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයන් හැර සෞඛ්‍ය සේවයේ අනිකුත් නිලධරයන් | ඌව පළාත් සභා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් | ඌව පළාත් සභා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් | ඌව පළාත් සභා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 10 | ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ රියදුරු | අදාළ ඌව පළාත් සභාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් | අදාළ ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම් | ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස්/පුහුණු) | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව |

## 1990 අංක 28 දරණ පනතින් සංශෝධිත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32 වන වගන්තිය ප්‍රකාරව ඌව පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ / සේවකයින්ගේ ස්ථාන මාරුවීම් පිළිබඳ බලතල පැවරීම (ක්‍රියාත්මක දිනය 2013/01/01)

| | සේවාව | ස්ථාන මාරු (පළාත තුළ) | | | පළාතෙන් බැහැර |
|---|---|---|---|---|---|
| | | ආයතනය/ දෙපාර්තමේන්තුව/ කලාප තුළ | අමාත්‍යාංශය යටතේවන දෙපාර්තමේන්තු අතර | අමාත්‍යාංශ අතර | |
| 11 | ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවයේ රියදුරු | ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | ඌව පළාත් සභා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් | --------- | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 12 | ඌව පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලය/ ඌව පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලය/ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ ඌව පළාත් සභා සමූපකාර සේවක කොමිෂන් සභාව/ ඌව පළාත් සභා අමාත්‍යාංශ කාර්යාල වල ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාල වල හා ඊට අදාළ දෙපාර්තමේන්තු වලට අයත් කණිෂ්ඨ කාර්ය මණ්ඩලය (ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතන හා ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක යටතට අයත්වන ආයතන හැර) | ඌව පළාතේ ආණ්ඩුකාරවර ලේකම්/ ඌව පළාත් සභාවේ සභා ලේකම්/අදාළ ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම්/අදාළ ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්/ ඌව පළාත් සභා සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්/අදාළ ඌව පළාත් සභාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් | අදාළ ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම්/ අදාළ ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් | ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස්/පුහුණු) | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 13 | මොණරාගල ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක හා බදුල්ල ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක යටතේ පවතින ආයතනවල කණිෂ්ඨ කාර්ය මණ්ඩලය | දිස්ත්‍රික්කය තුළ - ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br><br>පළාත තුළ - ඌව පළාත් සභා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | අදාළ ඌව පළාත් සභා අමාත්‍යාංශ ලේකම් | අදාළ ඌව පළාතේ ප්‍රධාන ලේකම් | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 14 | නගර සභා/ ප්‍රාදේශීය සභා කාර්යාල වල කණිෂ්ඨ සේවකයින් (කා.කා.ස.සේවය හා අංක 16 සඳහන් තනතුරු හැර) | අදාළ වන පරිදි පළාත් පාලන ආයතනයේ පරිපාලන බලධරයා/ පළාත් පාලන කොමසාරිස් | ඌව පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් | ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස්/පුහුණු) | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව |

# 1990 අංක 28 දරණ පනතින් සංශෝධිත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32 වන වගන්තිය ප්‍රකාරව ඌව පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ / සේවකයින්ගේ ස්ථාන මාරුවීම් පිළිබඳ බලතල පැවරීම (ක්‍රියාත්මක දිනය 2013/01/01)

| | සේවාව | ස්ථාන මාරු (පළාත තුළ) | | | පළාතෙන් බැහැර |
|---|---|---|---|---|---|
| | | ආයතනය/ දෙපාර්තමේන්තුව/ කලාප තුළ | අමාත්‍යාංශය යටතේවන දෙපාර්තමේන්තු අතර | අමාත්‍යාංශ අතර | |
| 15 | මහා නගර සභා සඳහා කණිෂ්ඨ සේවකයින් (කා.කා.ස.සේවය හැර) | අදාළ වන පරිදි නාගරික කොමසාරිස්/පළාත් පාලන කොමසාරිස් | ඌව පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් | ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස්/පුහුණු) | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 16 | නගර සභා හා ප්‍රාදේශීය සභා වල මාර්ග/සෞඛ්‍ය/ විදුලි හා ජල කම්කරුවන් | අදාළ වන පරිදි පළාත් පාලන ආයතනයේ පරිපාලන බලධරයා/ පළාත් පාලන කොමසාරිස් | ඌව පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් | ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස්/පුහුණු) | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 17 | ඉහත 1 සිට 16 දක්වා සඳහන් කර ඇති තනතුරුවලින් ආවරණය නොවන ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ අනෙකුත් තනතුරු | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව |